# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ISO 9001 | SLAB ACCREDITED ISO/IEC 17021 QMS-001-01

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / General Telephone - 011 - 2093000


මගේ අංකය / My No. } CSWP/ENG-ACC/1-1/FI/1    ඔබේ අංකය / Your No. }    දිනය / Date } 2020.09.17

ගොඩනැගිලි අධ්‍යක්ෂ,

අධ්‍යක්ෂ ඉංජිනේරු,

ප්‍රධාන ගණකාධිකාරී,

මූලස්ථාන ඉංජිනේරු,

සියළුම ප්‍රාදේශීය ඉංජිනේරුවරු,

ඉංජිනේරු - අර්.ඒ.බී.රණසිංහ මයා

ගණකාධිකාරී,

පරිපාලන නිලධාරි / මුදල් සහකාර,

<u>විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම - III වන කාර්තුව</u> 2020.
<u>පළාත් ඉංජිනේරු කාර්යාංශය</u>

2020.08.28 දින පැවැති තෙවන කාර්තුවේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ සාකච්ඡා සටහන් වාර්තාව කාරුණිකව මේ සමඟ ඉදිරිපත් කරමි.

කේ.ඩී.එල්.කඳනආරච්චි
ප්‍රධාන ගණකාධිකාරී
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) වෙනුව,
පළාත් ඉංජිනේරු කාර්යාංශ,
බස්නාහිර පළාත.

**විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 2020.08.28**

**පළාත් ඉංජිනේරු කාර්යාංශය**

2020 වර්ෂයේ III කාර්තුවට අදාලව 2020.08.28 දින නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) කාර්යාලයේ දී පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ වාර්තාව පහත ඉදිරිපත් කරමි.

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ඉංජිනේරු ඒ.ඒ.පි.එස්.කේ.කරුණාරත්න මයා විසින් පැමිණ සිටි සියළු නිලධාරින් පිළිගැනීමෙන් අනතුරුව පෙ.ව.10.00 ට රැස්වීමේ කටයුතු ආරම්භ කෙරුණි.

**රැස්වීමට සහභාගී වූ නිලධාරින්**

1. ඒ.ඒ.පි.එස්.කේ.කරුණාරත්න මයා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ඉංජිනේරු - පළාත් ඉංජිනේරු කාර්යාංශය
2. කේ.කේ.එස්.මහේෂ් විජේසේකර මයා - ගොඩනැගිලි අධ්‍යක්ෂ - පළාත් ඉංජිනේරු කාර්යාංශය
3. කේ.ජී.පී.ප්‍රසන්න මයා - අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණක - අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව
4. සී.එස්.ලොකුගේ මිය - විගණන අධිකාරී - ජාතික විගණන කාර්යාලය
5. කේ.ඩී.එල්. කඳනආරච්චි මිය- ප්‍රධාන ගණකාධිකාරී - පළාත් ඉංජිනේරු කාර්යාංශය
6. ඒ.තලංගම මයා - මූලස්ථාන ඉංජිනේරු- පළාත් ඉංජිනේරු කාර්යාංශය
7. ඒ.කේ.රුවන් අලවත්ත මයා - ප්‍රාදේශීය ඉංජිනේරු මීගමුව.
8. එච්.ඒ.කේ.ආර්.පෙරේරා මයා - ප්‍රාදේශීය ඉංජිනේරු හොරණ.
9. එස්.බී.සම්පත් මයා - ප්‍රාදේශීය ඉංජිනේරු පානදුර
10. ජී.ඩී.විපුලසේන මිය- ප්‍රාදේශීය ඉංජිනේරු බත්තරමුල්ල
11. එල්.ඩී.ගලබඩ මිය - ප්‍රාදේශීය ඉංජිනේරු මීනුවන්ගොඩ
12. පී.එල්.ඩී.ඒ.එස්.පනාගොඩ මිය - ප්‍රාදේශීය ඉංජිනේරු බියගම
13. එස්.ඩී.සේනාරත්න මිය- ප්‍රාදේශීය ඉංජිනේරු රත්මලාන
14. ආර්.එම්.ඒ.එස්.සකුන්තලා මිය - ප්‍රාදේශීය ඉංජිනේරු ගම්පහ
15. ආර්.එල්.එන්.රාජපක්ෂ මයා - ප්‍රාදේශීය ඉංජිනේරු හෝමාගම
16. ඩබ්.ජී.ආර්.වේලාතන්ත්‍රි මයා - ප්‍රාදේශීය ඉංජිනේරු මතුගම
17. පී.ආර්.මධුරංග මයා - ප්‍රාදේශීය ඉංජිනේරු වත්තල
18. පී.ඩී.ආර්.නදීරා මිය - ප්‍රාදේශීය ඉංජිනේරු කොළඹ
19. එම්.ජේ.එම්.ඩී.එස්.එස්.ජයවර්ධන මිය - ප්‍රාදේශීය ඉංජිනේරු කළුතර
20. බී.ඩී.සී.එස්.බඹරගම මිය - පරිපාලන නිලධාරී - පළාත් ඉංජිනේරු කාර්යාංශය
21. ඩබ්.අයි.නිලාන්ති මෙය - මුදල් සහකාර - පළාත් ඉංජිනේරු කාර්යාංශය
22. ජේ.වමින්ද මයා - කළමනාකරණ සහකාර - පළාත් ඉංජිනේරු කාර්යාංශය
23. එම්.එම්.පී.පෙරේරා මිය - උපාධිධාරී අභ්‍යාසලාභී - පළාත් ඉංජිනේරු කාර්යාංශය

## 01. පසුගිය විගණන කමිටු වාර්තාවේ ප්‍රගතිය සාකච්ඡා කිරීම

| | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය/වගකීම |
|---|---|---|---|
| 1.1 ඡේදය | (I) පළාත් සහා නව ගොඩනැගිල්ලට ඔරලෝසු මිලදී ගැනීම WNP/CB/R/CS/2020/AQ/10 හා 2020.02.28 | අදාල ඡේද සඳහා පැහැදිලි කිරීම ප්‍රධාන ලේකම් වෙත යොමු කරන ලද බවත් ඒ අනුව ප්‍රධාන ලේකම් විසින් විමසුමට පිළිතුරු ඉදිරිපත්කර ඇති බවත් සාකච්ඡාවිය. පළාත් සභා ගොඩනැගිල්ලේ සියලුම සවිකිරීම් (Fixed) ඉන්වෙන්ට්‍රි භාරකාරත්වය නි.ප්‍ර.ලේ. (ඉංජිනේරු) වෙත පැවරි ඇති බවත් ඒ පිළිබඳව ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බවත් සාකච්ඡාවිය. | විගණන විමසුමෙන් දන්වා ඇති කරුණුවලින් ලැබීම් ඉන්වෙන්ට්‍රි ගත කිරීම හා නිකුත් කිරීමට අදාල පැහැදිලි කිරීම් විගණන අධිකාරි පිළිගන්නා ලදි. අනිකුත් කරුණු පිළිබඳව විගණන අධිකාරි එකඟ නොවන බව සඳහන් කරන ලදි |
| | (II) හෝමාගම ඉංජිනේරු කාර්යාලයේ ප්‍රසම්පාදන ක්‍රමවේදයට අදාල විගණන විමසුම | මෙම විමසුමට පිළිතුරු අභ්‍යන්තර විගණන අංශයට යොමුකර පිටපතක් රජයේ විගණන අංශයටද යොමු කළ බැව් සාකච්ඡාවිය.<br>විමසුමට භාජනය වූ ප්‍රසම්පාදන ක්‍රමවේදයේ අඩුපාඩුකම් පිළිබඳව ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් මත නිකුත්කර ඇති ගැසට් නිවේදනය ප්‍රකාරව ප්‍රධාන ලේකම් කාර්යාලයේ උපදෙස් පරිදි ඉදිරියේදි පුහුණු කිරීම් හා දැනුවත් කිරීම් සිදුකල හැකි බවත් දැනට මෙම ගැසට් නිවේදනය පිළිබඳ සියලුම ප්‍රාදේශීය ඉංජිනේරුවරුන් දැනුවත් කර ඇති බවත්, ඊට අනුගත වීම හා ඒ සම්බන්ධව ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්ට ගැටළුවක් වේ නම් ඒ පිළිබඳව ද සාකච්ඡා කරන බව වැඩිදුරටත් දන්වා සිටින ලදි. | මෙම විමසුමට අදාල පිළිතුරු අභ්‍යන්තර විගණන අංශය විසින් පරීක්ෂාකර ඉදිරි කටයුතු පිළිබඳ දැනුවත් කිරීම<br><br>අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණන අංශය |
| 1.2 | (I) තාක්ෂණ ඇගයීම් කමිටුව සඳහා ගණකාධිකාරිවරයකු නම් කිරීම පිළිබඳ | ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවල තාක්ෂණ ඇගයීම් කමිටු සඳහා මූල්‍ය දැනුමක් ඇති ගණකාධිකාරිරුන්ගේ සාහය ලබා ගන්නා ලෙස දැනුම් දීමෙන් අනතුරුව දැනටමත් කාර්යාලවලින් එම කමිටු සාමාජික නිර්දේශකර අනුමැතියද යවා ඇති බව සාකච්ඡාවිය. දැනට ගණකාධිකාරිවරයෙකුගේ සහය ලබා ගැනීමට අපහසුව් ඇති කාර්යාල වලින්ද ( කොළඹ /පානදුර/ හෝමාගම/ බියගම) සුදුසු නාම යෝජනා ලබාගෙන අනුමැතියට ඉදිරිපත් කරන බව ද සාකච්ඡාවිය. | ප්‍රාදේශීය ඉංජිනේරුවරු කොළඹ / හෝමාගම / පානදුර / බියගම |
| | (II) නව පළාත් සභා ගොඩනැගිල්ලේ ඉදිකිරීම කටයුතු සඳහා පළාත්බඳ මාර්ග සංවර්ධන අධිකාරියට මුදල් ගෙවීම පිළිබඳව | නව පළාත් සභා ගොඩනැගිල්ලේ ඉදිකිරීම කටයුතු සඳහා පළාත්බඳ මාර්ග සංවර්ධන අධිකාරියට මුදල් ගෙවීම පිළිබඳව හා අත්තිකාරම් මුදල් ලෙස ගෙවීමේදි කාර්යසාධන සුරක්ෂණයක් ලබාගෙන නොතිබූ බව විගණන අධිකාරි නිරීක්ෂණය කර ඇත. එවැනි අවස්ථාවක කොන්ත්‍රාත්කරුට අතරමගදමා ගියහොත් බැඳුම්කරයක් ලබා ගැනීමෙන් පාඩුව අවමකර ගැනීමේ හැකියාව ඇති බව දන්වන ලදි. | ප්‍රධාන ගණකාධිකාරි |

| | | | |
|---|---|---|---|
| | | පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවීම් සිදුකර ඇත්තේ අත්තිකාරමක් ලෙස නොව කලවැඩ අනුව බවත්, අමාත්‍ය මණ්ඩල තිරණ අනුව සියලු ඉදිකිරීම් කටයුතු PRDA ආයතනයට පවරා තිබීමත්, එම ව්‍යාපෘතියේ ව්‍යාපෘති ඉංජිනේරු ලෙස PRDA ආයතනය කටයුතු කර ඇති බවත් නි.ප්‍ර.ලේ. පැහැදිලි කරන ලදි. ඉංජිනේරු කාර්යාංශයෙන් ඒ සඳහා ප්‍රධාන ලේකම්ට සහය වීමත්, කාර්යාංශයේ වැය ශිර්ෂය මඟින් ගෙවීම් කටයුතු සිදුකිරීම සිදු වී ඇති බවත් විස්තර කරන ලදි.<br>පූර්ව විගණන කමිටුවේදී මෙම කරුණ මතු කිරීමෙන් පසු ඊට අදාල සියලුම පාලන ගොනු ගෙවීම් වවුචර් පරීක්ෂා කිරීමේදි පහත ක්‍රම වේදය අනුගමනය කර ගෙවීම් කටයුතු සිදු කර ඇති බැව් පැහැදිලි කරන ලදි.<br>A. පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉදිරිපත් කරනු ලබන බිල්පත් හා අදාල ලියකියවිලි ගෙවීම් කිරීමට ප්‍රථම අධ්‍යක්ෂ(ඉංජිනේරු) වෙත යොමුකර ගෙවිය යුතු මුදල පිළිබඳ නිර්දේශයක් ලබා ගැනීම.<br>B. එම නිර්දේශිත බිල් වටිනාකම PRDA ආයතනයට නිදහස් කිරීම සඳහා පහත නිලධාරින්ගෙන් සමන්විත මෙහෙයුම් කමිටුවේ අනුමැතිය ලබා ගැනීම.<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය)<br>ගොඩනැගිලි අධ්‍යක්ෂ<br>ඉංජිනේරු කාර්යාංශයේ ප්‍රධාන ගණකාධිකාරි<br>(මෙම කමිටුව ප්‍රධාන ලේකම් විසින් පත්කර ඇත.)<br>C. ඉහත A හා B සම්පූර්ණ වීමෙන් පසු PRDA ආයතනයට ගෙවීමට නියමිත බිල් වටිනාකම වැය ශිර්ෂයට හර කර චෙක්පත් මඟින් ගෙවීම<br><br>ඒ අනුව එම ගෙවීම් පිළිබඳ අනුගමනය කළ ක්‍රමවේදය, පිළිවෙල, විධිමත් අනුකල බවත් ඊට අදාල සියලුම පාලන ගොනු ගෙවීම් වවුචර් විගණන පරීක්ෂාවට ඉදිරිපත් කලහැකි බව දන්වන ලදි. | |
| 1.3 | ව්‍යාපෘති සඳහා මුදල් වෙන් කිරීමේදි ව්‍යාපෘති වාර්තාවක් ලබා ගැනීමේ වැදගත්කම අභ්‍යන්තර විගණන අංශයෙන් දක්වා තිබුණි. | ශක්‍යතා වාර්තාවක් ලබා ගැනීම මුලික වශයෙන් (අධ්‍යාපන/සෞඛ්‍ය) ව්‍යාපෘති සඳහා අදාල අමාත්‍යාංශ හා සැලසුම් අංශය මඟින් සිදුවිය යුතු නමුත් තාක්ෂණික ශක්‍යතා වාර්තාව(Technical Feasibility report) ඉංජිනේරු කාර්යාලය මඟින් සිදුකිරීමේ වැදගත්කම නි.ප්‍ර.ලේ. ඉංජිනේරු පෙන්වා දෙන ලදි. දැනට සංඛ්‍යාත්මකව ඇස්තමේන්තු විශාල ප්‍රමාණයක් ඉංජිනේරු කාර්යාලය මඟින් සකස් කර ලැබුවද මුල්‍ය ප්‍රතිපාදන ව්‍යාපෘති කිපයක් සඳහා වෙන්වීමෙන් අනවශ්‍ය කාලයක් හා ශ්‍රමයක් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදි වැය වන බවත් ඉල්ලීම් අනුව මුලික ආස්තමේන්තුවක් | නි.ප්‍ර.ලේ. ඉංජිනේරු/ ගොඩනැගිලි අධ්‍යක්ෂ |

| | | | |
|---|---|---|---|
| | | පිළියල කර මූල්‍ය ප්‍රතිපාදන වෙන්වී ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා අංග සම්පූර්ණ හා නියමිත පරිදි ඇස්තමේන්තු සැකසීම සුදුසු බව ප්‍රාදේශීය ඉංජිනේරුවරු දැනුවත් කරන ලදි. ඒ අනුව ඉදිරි ඇස්තමේන්තු පිළියෙල කිරීම හා තාක්‍ෂණික ශක්‍යතා වාර්තාවක් පිළියෙල කිරීමේදී අදාල කරගත හැකි සරල ආකෘතියක් සතියක් තුල එවීමට කටයුතු කරන බව. | |
| 2.1 | "Complain Management" විගණන විමසුම අංක: WNP/CB/R/EB/2020/AQ/5 හා 2020.02.10 | විගණන විමසුමට පිළිතුරු ඉදිරිපත් කර ඇත. මෙම පරිගණක මෘදුකාංගය දැනට භාවිතයට ගැනීමට පියවර යොදා ඇති අතර ඒ මඟින් අළුත්වැඩියා ඉල්ලීම් ITRD ආයතනයට යොමු කරන බවත් ක්‍රියාත්මක තත්ත්වය පිළිබඳ 100% සෑහීමකට පත්විය නොහැකි වුවත් යථා කාලයේදී එම මෘදුකාංගය උපරිම ප්‍රයෝජනයට ගැනීමට එකඟවිය. | මූලස්ථාන ඉංජිනේරු |
| 2.2 | හය මාසය ඉක්මවා නිරවුල් නොවූ චෙක්පත් | 2019.04.30 දිනට පානදුර ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ චෙක්පත් 15 ක් ඇති බව විගණන අධිකාරී දන්වා සිටියදී 2020 ජුලි මස බැංකු සැසඳුම් වාර්තාව අනුව චෙක්පත් 5 ක් පමණක් පවතින බවත් එම චෙක්පත් අග්‍රහාර චෙක්පත් බවත්, දැනට අග්‍රහාර රක්‍ෂණ චෙක්පත් පිළිබඳව පසු විපරම් කර ඇති බවත් සාකච්ඡා විය. එම චෙක්පත් නැතිවී ඇති බව වාර්තා කර ඇත්නම් මූල්‍ය රීති ප්‍රකාරව හානි රක්‍ෂණ බැඳුම්කරයක් ලබා ගෙන පැරණි චෙක්පතට ගෙවීම් කිරීම අත්හිටුවීමට බැංකුවට දන්වා හිලව් චෙක්පත් නිකුත් කරන ලෙසත් මෙම තත්ත්වය මගහරවා ගැනීමට අවධානය යොමු කරන ලෙසත් ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්ට දන්වන ලදි.<br>අභ්‍යන්තර විගණන අංශයට බැංකු සැසඳුම් පිටපත් කොළඹ හා පානදුර කාර්යාලවලින් එවා නැති බව අභ්‍යන්තර විගණක දන්වා සිටිය අතර සතියක් තුල යැවීමට දැන්විය. | සියළු ප්‍රාදේශීය ඉංජිනේරුවරු |
| 2.3 | හානි පාඩු සම්බන්ධව | අවසන් වාර්තාව මාස 2 ක් තුල ඉදිරිපත් කිරීමට නොහැකි වූ හේතු පැහැදිලි කල අතර, අනතුරු 28 කින් 8 ක වාර්තා අවසන් බවත්, ඉතිරි අනතුරු සම්බන්ධව තොරතුරු කමිටුවකට යොමුකර කටයුතු අවසන් කිරීමට යෝජනා විය. විගණන අධිකාරිගේ නිරීක්‍ෂණ අනුව හානියේ වටිනාකම අනුව ප්‍රමුඛතාවයට පෙළ ගැස්වීමට තිරණය විය. ඒ අනුව රුපියල් ලක්‍ෂයට අඩු අලාභයන් මාසයක් තුල අවසන් කිරීමටත්, රුපියල් ලක්‍ෂයට වැඩි අලාභ ඊලඟ මාසයේදී අවසන් කිරීමටත් තිරණය විය. | පරිපාලන නිලධාරි |
| 2.4 | අත්තිකාරම් බී ගිණුමට අදාලව ණය අය නොවීම. | සේවය හැර ගිය විශ්‍රාම ගිය, මියගිය, පැරණි ණය ශේෂ පිළිබඳව දැනට පසුවිපරම් කටයුතු සිදු කරන අතර පහත ප්‍රගතිය ලැබී ඇති බැව් ප්‍රධාන ගණකාධිකාරි පැහැදිලි කරන ලදි. | ප්‍රධාන ගණකාධිකාරි / ගණකාධිකාරි/ ප්‍රාදේශීය ඉංජිනේරුවරු / විෂය භාර නිලධාරි |

| | | | |
|---|---|---|---|
| | | • සේවය හැර ගිය ණය ශේෂයන් අයකර ගැනීමට නීති මඟින් කටයුතු කිරීමට නීති අංශයට යොමු කර ඇත.<br>• පැරණි වර්ෂවල විශ්‍රාම ගිය නිලධාරීන්ගේ ණය ශේෂ පිළිබඳ විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විමසා ලබාගත් තොරතුරු අනුව එම මුදල් ගිණුම් ගත කර ඇති ආකාරය ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවලින් ලබා ගැනීමට.<br>• ප්‍රවර්තන වර්ෂයේදී ස්ථානමාරු වී ගිය ස්ථාන මාරු වී පැමිණි හා විශ්‍රාම ගිය ණය ශේෂ පිළිබඳව යාවත්කාලීනව කටයුතු කිරීම.<br><br>මේ පිළිබඳව ප්‍රගතිය හා ඉදිරියට ගතයුතු ක්‍රියා මාර්ග පිළිබඳ සවිස්තර වාර්තාවක් ඊළඟ කමිටුවට ඉදිරිපත් කිරීම. | |
| 2.5 | කල් ඉකුත්වූ තැන්පතු | රැඳවුම් මුදල් ආපසු ගෙවීම සඳහා 2019 දෙසැම්බර් සිට අක්මුදල් නොලැබීමෙන් සියලුම ප්‍රාදේශීය කාර්යාල වල දැනට රු.මි. 65 පමණ රැඳවුම් මුදල් ගෙවීමට නොහැකිවී ඇත. ඒ සඳහා අක්මුදල් ඉල්ලා ඇති අතර කඩිනමින් එම මුදල් නිදහස් කිරීමටත් වසර 2 කට වඩා තැන්පත් ගිණුමේ රඳවා ඇති රැඳවුම් මුදල මු.රි. ප්‍රකාර කටයුතු කරන ලෙස දැනුම් දෙන ලදී. | ප්‍රධාන ගණකාධිකාරී / ගණකාධිකාරී / සියලුම ප්‍රාදේශීය ඉංජිනේරු |
| 2.6 | පොදු ආකෘති පත්‍ර කමිටු වාර්තාව | කටයුතු අවසන් කිරීමට ඉල්ලා ඇති නිරීක්ෂණ ලද පසු කටයුතු කිරීමත් ඊළඟ කමිටුවේදී කටයුතු නිම කිරීමටත් දැන්විය. එම ආකෘති පත්‍ර කට්ටල ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල වෙත යොමු කිරීමටත් එම කට්ටල 2 ක් විගනණ අධිකාරී හා අභ්‍යන්තර විගණන අංශයට යැවීමටත් තීරණය විය. | ගොඩනැගිලි අධ්‍යක්ෂ/ පරිපාලන නිලධාරි |
| 2.7 | වාහන අනතුරු සඳහා රක්ෂණාවරණය ලබා ගැනීම | දැනට පත් කර ඇති කමිටුවට තොරතුරු නොමැතිවීමෙන් කටයුතු අවසන් කිරීමට අපහසු බැව් දන්වා සිටිය ද පවතින තොරතුරු මත ඊලග කමිටුවේ දී අනිවාර්යයෙන්ම මෙම කටයුතු අවසන් කිරීමට තීරණය විය. | පරිපාලන නිලධාරි |
| 2.8 | මීගමුව ධීවර සමිතිය | ඉඩමේ අයිතිය පිළිබඳ ව මේ දක්වා එකඟතාවයක් නොමැති හෙයින් රජය සතු වත්කම් බාහිර පාර්ශවයක් භුක්ති විඳිම අසතුටුදායක තත්වයක් හෙයින් ගරු ආණ්ඩුකාරතුමාගේ අවධානයට යොමු කර එතුමාගේ මැදිහත්වීමෙන් ප්‍රදේශීය ලේකම් හරහා අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීමට තීරණ විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) / ඉංජිනේරු රණසිංහ මයා |
| | අවිස්සාවේල්ල ඉඩම | ප්‍රවාහන අමාත්‍යාංශ ලේකම් සමඟ සාකච්ඡාවක් පැවැත්වීමේ දිනයක් ලබා ගැනීම වාර තුනකදී ප්‍රමාද වී ඇති අතර දැනට එම අමාත්‍යාංශයේ නව ලේකම්තුමාගෙන් දිනයක් වෙන් කරවා ගැනීමට කටයුතු කිරීම.<br><br>දැනට සෘජුව බැංකුවට තැන්පත් කරනු ලබන රු.20,000/- ක කුළිය අත්හිටුවීමටත් ඉතා ඉහල වටිනාකමක් ඇති මෙම දේපල ආපසු ලබා ගැනීමේ කටයුතු කඩිනම් කිරීමටත් තීරණය විය. | පරිපාලන නිලධාරි / ඉංජිනේරු රණසිංහ මයා |

| | | | |
|---|---|---|---|
| 2.9 | බියගම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය | වර්තමාන තත්ත්වය බියගම ප්‍රාදේශීය ඉංජිනේරු සඳහන් කල අතර නැවත සෞඛ්‍ය ලේකම්ට අවශ්‍ය පැහැදිලි කිරීම් යවා රජයේ ආයතනයක භූමියෙන් රජයේ ආයතනයකට ඉඩම් කොටසක් ලබා ගැනීමේ හැකියාව පිලිබඳව ප්‍රාදේශීය ලේකම් සමඟ සාකච්ඡාකර විසඳා ගැනීමට තීරණ විය. | ගොඩනැගිලි අධ්‍යක්ෂ / බියගම ප්‍රාදේශීය ඉංජිනේරු |
| 2.10 | පුහුණු කටයුතු | දැනට පුහුණු කටයුතු නවතා ඇති අතර ඉදිරියේදී ප්‍රසම්පාදන ක්‍රමවේදයේ නව සංශෝධන පිළිබඳ පුහුණුවීම් සිදු කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) / ගොඩනැගිලි අධ්‍යක්ෂ |

**2 ) විගණන අධිකාරි විසින් මතු කල කරුණු**

| | මතුකළ කරුණු | පැහැදිලි කිරිම | තීරණය |
|---|---|---|---|
| 1 | නව ගොඩනැගිල්ලේ ඉදිරි පිවිසුමේ සිදු කරන ලද අළුත්වැඩියා කටයුතු | මෙම අළුත්වැඩියාව ඉටුකර දෙන ලෙස PRDA ආයතනයට දැනුම් දුන්නද ඉටු නොවීම නිසා ප්‍රධාන ලේකම්ගේ උපදෙස් හා ගොඩනැගිලි කමිටු තීරණ අනුව නව ගොඩනැගිල්ලේ නඩත්තු කටයුතු ඉටු කරන කොන්ත්‍රාත්කරුගෙන් රු.මි. 1.8 වියදමින් ඉටුකර ගත් බවත් මෙවැනි තත්වයක් මතුවීමට බලපෑ තාක්ෂණික කරුණු නි.ප්‍ර.ලේ (ඉංජිනේරු) පැහැදිලි කල අතර මූලික වශයෙන් ගොඩනැගිලි ඉදි කිරීම් ව්‍යාපෘතියේ උපදේශන සේවා සැපයූ ආයතනයේ අඩුපාඩුවක් ලෙස නිරීක්ෂණය වන බව දන්වන ලදී.<br><br>ඒ අනුව අළුත්වැඩියා සඳහා දැරීමට සිදුවූ වියදම PRDA ආයතනයේ ඇති රැඳවුම් මුදල් මඟින් ප්‍රතිපූරණය කර ගැනීමට කටයුතු කරන බව දැන්විය. | මෙම ගොඩනැගිල්ල සැලසුම් කිරීමේදී මෙවැනි දෝෂ සිදුවී ඇත්නම් ඊට අදාල පාර්ශව වෙතින් අයකර ගැනීම හා මේ හැර තවත් මෙවැනි දෝෂ (සැලසුම් කිරීමේදී හා ඉදි කිරීමේදී) පවතිනවා නම් ඉදිරියේදී මීට වඩා හානි සිදුවීම වැලැක්වීමේ පියවර යොදෙන ලෙස විගණන අධිකාරි දන්වන ලදී. |

| | | | |
|---|---|---|---|
| 2 | නව ගොඩනැගිල්ලේ ඉහල මාලයේ ස්ථාපිත ජල ටැංකිය උතුරා යාමෙන් සිදුවූ අලාභ හානි | මෙම අනපේක්ෂිත අලාභ හානිය සිදුවීමට බලපෑ තාක්ෂණික කරුණු මූලස්ථාන ඉංජිනේරු පැහැදිලි කල අතර මෙම අලාභහානිය ද ඉදිකිරීමේ සැලසුම්කරණ දෝෂ බවත් දැනට මෙම සැපයුම්කරුගේ සේවා ගිවිසුමද අත්හිටුවා ඇති අතර සිදුවූ අලාභය ගණනය කර එම හානිය රක්ෂණයෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කරන බව මූලස්ථාන ඉංජිනේරු දැන්විය.මෙම ජලය උතුරා යාම නිසා වායු සමීකරණ පද්ධතිය ගිනි නිවීමේ පද්ධතියට ද (Fire System) හානි සිදුවිය හැකි බැවින් එම අලාභයන්ද ගණනය කර මුළු පාඩුව රක්ෂණයට දැන්වීමට කටයුතු කරනු ඇත. | - එම - |
| 3 | 2019 වාර්ෂික ගිණුමේ ඇතුලත් අඩුපාඩු<br><br>අක්මුදල් ගැලපුම් ගිණුමක් පිලියෙල කර නොතිබීම<br><br>මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශ ආකෘතියේ (9) 2018.12.31 දිනට ශේෂය ආරම්භක ශේෂය ලෙස ඇතුලත් කර නොතිබීම හා මාරු කිරීම් යටතේ මි. 55 ක් වෙන් කර තිබීම. | ප්‍රථම වරට 2019 සිට මූල්‍ය ප්‍රකාශ සඳහා හඳුන්වාදුන් ආකෘති ප්‍රකාර ගිණුම ඉදිරිපත් කල බවත් ඉංජිනේරු කාර්යාල පොත්පත් අනුව ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් ලැබෙන අක්මුදල් හා ගිණුම් සාරාංශ වියදම හා වර්ෂාවසාන ශේෂ පියවීම ඇතුලත්ව අක්මුදල් ගිණුමක් සකස් කර ඇති බැව් ප්‍රධාන ගණකාධිකාරී පැහැදිලි කරන ලදී.<br><br>විගණනයෙන් පෙන්වා දුන් මෙම කරුණු ඊලග වර්ෂ වාර්ෂික ගිණුමේ දී අවධානය යොමු කල හැකි බව සඳහන් කරන ලදී.<br><br>වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරීමට අදාලව නිකුත් වූ චකුලේඛ උපදෙස් අනුව වත්කම්වල ආරම්භක ශේෂ සටහන් කිරීම අනිවාර්යය නොවූ අතර 2020 වර්ෂයේ දී වාර්ෂික ගිණුම්වල මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ ආරම්භක ශේෂ ලෙස ප්‍රධාන කාර්යාලයේ හා ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල වල එම ශේෂයන් ඇතුලත් කිරීමත් ඒ අනුව 2018.12.31 දිනට විසර්ජන ගිණුමේ දක්වා ඇති වත්කම් නැවත ප්‍රත්‍යාගණනය කර 2020 ගිණුම් වල ආරම්භක ශේෂ ලෙස දැක්වීමට කටයුතු කරන බව දැන්විය. | ප්‍රධාන ගණකාධිකාරී / පරිපාලන නිලධාරී / සියලුම ප්‍රාදේශීය ඉංජිනේරුවරුන් |

| | | | |
|---|---|---|---|
| | ස්ථාවර වත්කම් ලේඛණය පිලියෙල කර නොතිබීම | දැනට 2019 වර්ෂයට අදාල ස්ථාවර වත්කම් ලේඛනය ද යාවත්කාලීන කෙරෙමින් පවතින අතර 2020 වර්ෂයේ වාර්ෂික ගිණුම් සමග නියමිත පරිදි ස්ථාවර වත්කම් ලේඛනය විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දැන්විය. | ප්‍රධාන ගණකාධිකාරී / ගණකාධිකාරී / පරිපාලන නිලධාරී / සියලුම ප්‍රාදේශීය ඉංජිනේරුවරුන් |

## (3) අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණන විසින් මතු කල කරුණු

| | මතුකළ කරුණු | පැහැදිලි කිරිම | වගකීම |
|---|---|---|---|
| i | ලිපිගොනු කළමනාකරණ ක්‍රියාවලිය සම්බන්ධ මෘදුකාංග පද්ධතියට (DMS) ITRDA ආයතනයට ගෙවීම | දැනට DMS මෘදුකාංගයේ ගෙවීම් කටයුතු සඳහා ITRDA ආයතනයේ රදවා ඇති රු.මි. 6 ක මුදල ආපසු අධ්‍යාපන අමාත්‍යාංශයට යැවීමට කටයුතු කර තිබීමෙන් මෙම මෘදුකාංගයේ ඉදිරි කටයුතු නතර විය හැකි බවත් අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණක පෙන්වා දෙන ලදි.<br><br>රු.මි. 6 ගෙවීමට නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) නිර්දේශ ඉල්ලා තිබුනද මෙම මෘදුකාංගය තුලින් අපේක්ෂිත මූලික කරුණු මේ වන විට සම්පූර්ණ වී නොමැති හෙයින් ඒ සඳහා නිර්දේශ ඉදිරිපත් කල නොහැකි බවත් දැනට DMS මෘදුකාංගය පිළිබඳව ගෙන ඇති ක්‍රියාමාර්ග හා ඉදිරි සැලසුම් නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් කමිටුව දැනුවත් කරන ලදි. එම මෘදුකාංගය ඉදිරියේදි ප්‍රධාන කාර්යාලයේ හා ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල වල භාවිතා කිරිමට හැකිවීම ඵලදායි හා කාර්යක්ෂම සේවාවක් වන බැව් නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) පැහැදිලි කරන ලදි.ඒ අනුව එහි ප්‍රගතිය පහත පරිදි වේ.<br><br>• අවබෝධතා ගිවිසුම අනුව (MOU) එකගවූ ලිපිගොනු Scan කිරිම දැනට ප්‍රධාන කාර්යාලයේ හා ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල 4 ක අවසන් බවත් ගිවිසුම් ප්‍රකාර සංඛ්‍යාව Scan කිරීමේදී අත්‍යාවශ්‍ය හා වැදගත් ලියවිලි සඳහා ප්‍රමුඛතාවය ලබා දීම හා ක්‍රියා නිම් ගොනු Scan කිරිම අනවශ්‍ය බව.<br><br>• දැනට මෙම මෘදුකාංගය මෙහයවීමේ කටයුතු අධීක්ෂණය සඳහා මාණ්ඩලික නිලධාරියෙකු පත් කර අදාල චක්‍ර ලේඛ උපදෙස් නිකුත් කර පසු විපරම් කටයුතු හා පුහුණු කිරිම සිදු කිරිමත් ඊට අදාල අංග සම්පූර්ණ අධ්‍යනයක් තුලින් නිවැරදි ක්‍රමවේදයකට අනුගත විම. | නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) / ගොඩනැගිලි අධ්‍යක්ෂ / අධ්‍යක්ෂ (ඉංජිනේරු) / ඉංජිනේරු විජයප්‍රිය මයා |

| | | | |
|---|---|---|---|
| ii | ඉංජිනේරු කාර්යාංශයේ නිර්දේශ නොලැබීම නිසා ITRDA ආයතනයේ 2013 සිට රඳවුම් මුදල් නිදහස් කිරීමට නොහැකි වීම | මේ සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා පැහැදිලි කිරීමක් ලබාදීමට කටයුතු කරන බව | මුලස්ථාන ඉංජිනේරු |
| iii | දෙපාර්තමේන්තු ප්‍රමාණ බිල්පත්‍ර රේට් ගණන් හා කොන්ත්‍රාත්කරුවන්ගේ මිල ගණන් අතර අසාමාන්‍ය වෙනස්කම් පැවතීම. | හංවැල්ල අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානයේ ඉදි කිරීම් ව්‍යාපෘතියේ නියැදියක් ලෙස මෙම කරුණු පරීක්ෂා කිරීමේදී සමහර අයිතම අතර 335%ක වැනි අසාමාන්‍ය වෙනස්කම් පවතින බව අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණක පෙන්වා දෙන ලදී.<br><br>ප්‍රායෝගිකව කොන්ත්‍රාත්කරුවන් මිල ගණන් ඉදිරිපත් කිරීමේදී ඔවුන්ට උපරිම වාසිදායක අයුරින් රේට් ගණන් ඉදිරිපත් කිරීම සිදුවන බවත් මේ පිලිබඳ ටෙන්ඩර් පත්‍ර ඇගයීම් කමිටුවලට වගකීමක් පැවරෙන බවත් සඳහන් විය.<br><br>ඒ අනුව තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින්ට මෙම තත්ත්වය පරීක්ෂා කර අදාල නිර්දේශ ඉදිරිපත් කිරීමට උපදෙස් සපයන ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) දන්වන ලදී. | ගොඩනැගිලි අධ්‍යක්ෂ / මුලස්ථාන ඉංජිනේරු / සියලුම ප්‍රාදේශීය ඉංජිනේරුවරු |
| iv. | 2020 මැයි මස විදුලිබිල්පතේ අසාමාන්‍ය වැඩි වීම | මෙම ගොඩනැගිල්ලේ මීටර් 3 රේට් ගණන් තුනක් පැවතීම හා (රු.25.50, 14.35, රු.10.00) විදුලි බිල්පත පාලනය කිරීමේ හැකියාව අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණක විමසන ලදී.<br><br>දැනට විදුලිබිල්පත ඉදිරිපත් වන ක්‍රමවේදය හා Face සඳහා මිල ගණන් තුනක් යටතේ බිල්පත් ගණනය කෙරෙන බව මෙම මුලස්ථාන ඉංජිනේරු පැහැදිලි කරන ලදී.<br><br>ඒ අනුව පසුගිය කොරෝනා කාල සීමාවේදී 8 වන මහලේ කොරෝනා මර්දන කාර්ය සාධන බලකාය 24 පැය තුල ක්‍රියාත්මක වූ අතර රාත්‍රී රාජකාරි සඳහා අතිරේකව AC සැපයීමට විදුලි සම්පාදනය කිරීමට සිදුවීමෙන් ඉහල රේට් ගණන් මත මැයි මස විදුලි බිල්පත ගණනය වීම සිදුවිය. 2020 මැයි විදුලි බිල මෙම හේතුව මත වැඩි වීමක් පෙන්නුම් කලද දැනට එම තත්වය පාලනය කර ඇති බව මුලස්ථාන ඉංජිනේරු දන්වන ලදී. | |

| | | | |
|---|---|---|---|
| V | මූල්‍ය චක්‍රලේඛ 9/2019 අනුව භාණ්ඩ බාරදීමට අදාල වාර්තා පාලන අංශයට යොමු නොකිරීම | එම තොරතුරු පාලන අංශය වෙත යවා ඇති බව පරිපාලන නිලධාරි ප්‍රකාශ කරන ලද අතර. මේ සම්බන්ධයෙන් පරීක්ෂා කරබලා තහවුරුවක් ලබා ගන්නා ලෙස නි.ප්‍ර.ලේ (ඉංජිනේරු) විසින් පරිපාලන නිලධාරීට උපදෙස් දෙන ලදි. | පරිපාලන නිලධාරී |
| vi | බැංකු සැසඳුම් වාර්තාවල ගැලපීම් නිරවුල් කිරීම. | බැංකු සැසඳුම් වාර්තා අනුව හඳුනානොගත් ලැබීම් දිගින් දිගටම නිරවුල්කර නොමැති බැව් අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණක පෙන්වා දෙන ලදී.<br><br>මේ සම්බන්ධයෙන් දැනට බැංකුවෙන් විමසීම් කර එම, හඳුනා නොගත් ලැබීම් නිසි පරිදි ගිණුම් ගත කිරීමට කටයුතු කර ඇති බව ප්‍රධාන ගණකාධිකාරි පැහැදිලි කරන ලදි.<br><br>මේ සම්බන්ධයෙන් සොයාබලා පැහැදිලි කිරීමක් ලබාදීමට කටයුතු කරන බව නි.ප්‍ර.ලේ .(ඉංජිනේරු) ප්‍රකාශ කරන ලදි | ගණකාධිකාරි / සියලුම ප්‍රාදේශීය ඉංජිනේරුවරු |

විගණන කළමනාකරණ කමිටු රැස්වීමට පැවැත්වීම ඉතා වැදගත් බවත් විගණනයෙන් ලබාදෙන ලද පැහැදිලි කිරීම් රාජකාරි කටයුතු වලදී යොදා ගැනීම සාර්ථකව රාජකාරි කිරීමට පහසුවක් බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ඉංජිනේරු විසින් ප්‍රකාශ කරන ලදි.

ප්‍රධාන ගණකාධිකාරි කේ.ඩී.එල්.කඳනආරච්චි මිය විසින් ස්තුති කතාව සිදු කර රැස්වීමේ කටයුතු පස්වරු 12.00 ට පමණ අවසන් කරන ලදි.

ඒ.ඒ.පි.එස්.කේ.කරුණාරත්න,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු).
පළාත් ඉංජිනේරු කාර්යාංශය